**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2017**

----------------------------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1996 පෙබරවාරි 09 දිනැති අංක 909/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 1996 අංක 01 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලියේ 21 වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය, සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2018 ජූලි 04 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය ව්‍යාවනය**

------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

ප්‍රමිතයේ 99 වන ඡේදය ප්‍රකාරව, අස්ථිත්වයක ඌනතාවය හෝ අතිරික්තය හඳුනා ගැනීමේදී, සියලුම ආදායම් හා වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ආයතනය විසින් පවත්වන ලද කෙටිකාලීන පාඨමාලා, වැඩමුළු සහ සම්මේලනය (PGIS Congress) සඳහා ලැබී තිබුණු රු.8,327,699 ක ආදායමෙන් දරන ලද රු.5,797,725 ක වියදම අඩුකර ශුද්ධ අගය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සටහන් කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වර්ෂය තුළ මුදලින් ලද ආයෝජන ආදායම රු.20,854,126 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය රු.24,642,620 ක් ලෙස දක්වා තිබුණි.

(ii) වර්ෂය තුළ ස්ථිර තැන්පත්වල සිදු කරන ලද මුළු ආයෝජනවල වටිනාකම රු.42,399,320 ක් වුවත්, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය රු.43,504,468 ක මුදල් ගලා යැමක් ලෙස ගැලපීම් කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම්වල වැඩිවීම රු.9,107,490 ක් වුවත්, එය රු.2,167,540 ක් ලෙස කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ හඳුනාගෙන ගිණුම්ගත කර තිබූ පී. අමරසිංහ ශිෂ්‍යත්ව අරමුදලට අයත් රු.475,803 ක ස්ථාවර තැන්පතුව හා රු.629,345 ක ඉතිරි කිරීම් තැන්පතුව මුදල් ගලා ඒමක් ලෙස මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් වත්කම් පන්ති 04 ක පිරිවැය රු.44,161,411 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනය සමාලෝචිත වර්ෂය තුළ කෙටිකාලීන පාඨමාලා 25 ක් පවත්වා රු.5,372,874 ක ආදායමක් උපයා තිබුණි. එහෙත් කෙටිකාලීන පාඨමාලාවලට අදාළ ආදායම ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලී ආදායම් රු.21,453,924 ක් වුවත්, එය රු.23,285,697 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.1,831,773 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ ස්ථිර තැන්පත් සහතික 13 ක් අවලංගු කර ලබාගත් මුදල් ආයතනයේ අරමුදලට බැර නොකිරීම මගින් සිදුකල රු.74,663,525 ක මූල්‍ය වංචාව හඳුනා ගෙන වසරකට අධික කාලයක් ගතවී තිබුණද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඊට අදාළ ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඇ) විසිවෙනි ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපන (HETC) ව්‍යාපෘතිය මගින් ඉකුත් වර්ෂය දක්වා ආයතනයට ලබා දුන් රු. 7,101,453 ක් වූ පරිගණක හා අනෙකුත් උපකරණ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | දේපල, පිරියත හා උපකරණ | 94,383,830 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ආ) | ප්‍රතිපත්ති වෙනස් කිරීම් මත සිදු කළ ගැලපීම් | 129,646,278 | උපලේඛන |
| (ඇ) | පාඨමාලා ගාස්තු ආදායම් | 59,739,331 | තහවුරු කර ගැනීමේ ලේඛන |
| (ඈ) | කෙටිකාලීන පාඨමාලා 04 ක වියදම් | 1,123,232 | පැමිණීමේ ලේඛන, වියදම් විස්තර, ඇගයීම් වාර්තා |
| | | 284,892,671 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර ආයතන සඳහා වාහන කුලියට ලබාදීමෙන් අයවිය යුතු රු.20,473 ක වාහන කුලී ආදායමක් වසරකට අධික කාලයක් ගතවී ඇතත්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෙටිකාලීන පාඨමාලා සහ වැඩමුළු වෙනුවෙන් ගෙවිය යුතු රු.6,413,381 ක මුදලක් පාඨමාලාව අවසන් වී මාස 05 සිට මාස 28 ක කාලයක් ඉක්මවා ඇතත්, නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 හා 2015 සැප්තැම්බර් 12 දිනැති අංක කම්.දෙ./රව්/15/2015 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපි | සේවක අර්ථසාධක අරමුදල් දායකය, විශ්‍රාම වැටුප් අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ගණනය කිරීමේදී අධ්‍යයන දීමනාව අදාළ කර නොගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් අධ්‍යයන දීමනාව ඇතුළත් කර ඉහත අරමුදල්වලට දායකය ගණනය කිරීම නිසා රු.703,233 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 751 | ආයතනය මගින් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 09 ක් සඳහා මිලදී ගෙන තිබූ රු.3,977,361 ක් වටිනා උපකරණ ආයතනය ඉන්වෙන්ට්‍රි ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.1,833,829 ක් වූ ගැලපුම් ගිණුමේ පැවති හර ශේෂය අනුමැතියකින් තොරව පොදු සංචිතයට කපා හැර තිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් දක්වා ඇති යහපාලනය සඳහා වන අත්පොතෙහි 8.2.2 වගන්තිය ප්‍රකාරව, සියලු අතිරික්ත මුදල්, මුදල් ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය මත ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, කෙටිකාලීන තැන්පතු හෝ වෙනත් ඵලදායි ආයෝජනයක යෙදවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ආයතනය ආයෝජනය කර තිබුණු රු.20,000,000 ක්වූ ආයෝජනය සඳහා කළමනාකරණ මණ්ඩලයේ හා මුදල් ඇමතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය ප්‍රතිඵලය රු.39,552,311 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය අතිරික්තය රු.17,917,356 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,634,955 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ආයෝජන ආදායම රු.6,427,905 කින් හා පාඨමාලා ගාස්තු රු.2,023,379 කින් වැඩි වීම සහ වැටුප් හා වේතන රු.7,453,520 කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබූ අතර, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.52,227,660 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.97,012,649 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්ය සාධනය

-------------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය

------------------------------------

ආයතනයේ ක්‍රියාත්මක පාඨමාලා 21 ක් සඳහා 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලියාපදිංචි වූ ශිෂ්‍යයින් 1,727 ක් අතුරින් ශිෂ්‍යයින් 957 ක් එනම් ලියාපදිංචි සිසුන්ගෙන් සියයට 55 ක් පාඨමාලා සම්පූර්ණ කර නොතිබුණි. පාඨමාලා වෙන් වෙන්ව සැලකූ විට සම්පූර්ණ නොකළ සිසුන්ගේ ප්‍රතිශතය සියයට 11 සිට සියයට 100 දක්වා පරාසයක පැවති අතර, ඉන් පාඨමාලා 04 ක් කිසිදු ශිෂ්‍යයකු සම්පූර්ණ කර නොතිබුණි. සම්පූර්ණ කළ යුතු කාලයද වසර 01 සිට වසර 05 දක්වා කාලයකින් ඉක්ම ගොස් තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ ආයතනයට අයත් ස්ථිර තැන්පත් සහතික 13 ක් අවලංගු කර ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසින් මුදල් අවභාවිතා කිරීම පිළිබඳව අනාවරණය වී වසරකට අධික කාලයක් ඉක්ම ගොස් තිබුනද, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව ගත යුතු කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

විගණනයට ඉදිරිපත් කරන ලද පර්යේෂණවලට අදාල ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු අනුව 2017 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ ව්‍යාපෘති 34 ක පර්යේෂණ ප්‍රදානවල ඉතිරිය රු. 23,972,571 ක් වූ අතර පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ සම්පූර්ණ විස්තර ආයතනය විසින් පවත්වාගෙන ගොස් තිබුණු ලිපිගොනුවල ඇතුලත්කර නොතිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ගනුදෙනුවක් සිදු නොවූ පර්යේෂණ ව්‍යාපෘති 14 ක 2017 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය රු.8,726,012 ක් විය.

(ආ) ආයතනය කෙටිකාලීන පාඨමාලා පවත්වා ලබන ආදායමින් සියයට 5 ක ප්‍රතිශතයක් අදාළ පාඨමාලාව පවත්වන අධ්‍යයන මණ්ඩලවල සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන නමුත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වෙන් කර තිබූ රු.790,177 ක මුදල උපයෝජනය කර නොතිබුණි

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ආයතනය විසින් මිලදී ගෙන තිබුණු රු.110,524 ක් වටිනා ටෝනර් 09 ක් ප්‍රයෝජනයට නොගෙන වර්ෂ 02 කට වැඩි කාලයක් ගබඩා කර තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

දීර්ඝ කාලයක් තුල පැවති ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 04 ක පුරප්පාඩු 05 ක් සම්බන්ධයෙන් 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 වගන්තියට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළව විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට / පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) වගන්ති ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලපරිච්ඡේදයක් තුළ ඉටුකිරීමට අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන අත්පොතේ 4.2.1 වගන්තිය මඟින් හඳුන්වා දුන් ආකෘතිය අනුව පිළියෙල කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 64.57 ක් වුවත්, වර්ෂය තුළ සිදුකර තිබූ ප්‍රසම්පාදන කටයුතුවල වටිනාකම රු. මිලියන 30.25 ක් විය. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

**6.2 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී විෂයයන් 41 ක සියයට 22 සිට සියයට 102 දක්වා විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම.<br>(ii) වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | පරිත්‍යාග ගිණුම්ගත නොකිරීම. |
| (ඇ) | පර්යේෂණ හා ප්‍රදාන | ආයතනයේ අරමුණු ඉටු කරගත හැකිවන පරිදි පර්යේෂණ කටයුතු සැලසුම්කර ක්‍රියාත්මක නොකිරීම. |
| (ඈ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු නොකිරීම. |